-------------------------------------------------------------------------------------------------------------------

කින්නියා ප්‍රාදේශීය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම අනුව කින්නියා ප්‍රාදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

2012 වර්ෂය තුලදී ආදායම් ඉපැයීම සහ සේවා සැපයීම් සඳහා සභාව විසින් එකතුව රු.6,690,350 ක්වූ ස්ථාවර වත්කම් භාවිතා කර තිබුණි. නමුත් ස්ථාවර වත්කම් ක්ෂයවීම් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින් ආදායම් ඉපැයීම සඳහා දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනයන්හි පිළිබිඹු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආදායම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මුළු ආදායම රු.14,658,899 ක් වුවද එය ගිණුම්වල රු.14,418,464 ක් ලෙස දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.240,435 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සභාවට අයවිය යුතුවූ රු.738,325 ක් වූ ආදායම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා නොතිබුණි.

(ඇ) රු.17,615 ක්වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) රු.316,768 ක් වූ සභාවේ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල නිලධාරින්ට දෙන ලද රු.60,000 ක් වූ අත්තිකාරම් අයකරගෙන නොතිබුණු අතර අවසාන ගිණුම්වලට ද ඇතුලත් කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 සිට 2006 දක්වා සභාව විසින් රු.2,315,384 ක්වූ විශ්‍රාමික දායක මුදල් අයකර තිබුණු අතර එම මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) කින්නියා නගර සභාවට ගෙවිය යුතු රු.1,983,482 ක් නිරවුල් කිරීමට සහ 2006 වර්ෂයේදී සභාවට අයවිය යුතුව තිබූ රු.897,795 ක් අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිටම රු.27,806 ක් වූ ණයගැති ශේෂ නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට පැවති රු.4,438,197 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා එම වියදම් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 1,441,310 | ස්ථාවර වත්කම් ලේඛනය, සමික්ෂණ මණ්ඩල වාර්තා |
| පිරියත් සහ යන්ත්‍රසූත්‍ර | 1,308,575 | |
| මෝටර් වාහන | 3,029,710 | |
| හිඟ ආදායම් | 5,335,992 | |
| ටෙන්ඩර් තැන්පතු | 1,120,220 | කාල විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛන |
| කල්බදු තැන්පතු | 281,250 | |
| විවිධ තැන්පතු | 573,306 | |
| පෙර ගෙවීම් | 173,544 | ලේඛනය, කාල විශ්ලේෂණ |

1.3.5 නීති, රීති, සහ රෙගුලාසි වලට අනුකූල නොවිම

නීති, රීති, සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | |
| (i) II කොටසේ 19(1)(1) වගන්තිය | - 2012 වර්ෂයේදි පළාත් පාලන කොමසාරිවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව අනියම් සේවකයන් පත්කර තිබුණු අතර සභා අරමුදලෙන් රු.387,889 ක් වූ වැටුප් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) II කොටසේ 158 වගන්තිය | - | සභාවේ සියළුම ප්‍රදේශ වලින් 2006 වර්ෂයේ සිට දේපල බදු අයකර නොතිබුණි. |

(ආ) ප්‍රාදේශිය සභා මූල්‍ය සහ පරිපාලන රීති - 1989
----------------------------------------

| | | |
|---|---|---|
| (i) VII පරිච්ඡේදයේ 164 වගන්තිය | - | ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු දිනපතා ගිණුම් වාර්තා පරික්ෂා කොට කෙටි අත්සන් යොදා නොතිබුණි. |
| (ii) IX පරිච්ඡේදයේ විවිධ 181-184 | - | මුදල් සහ ගබඩා පරිහරණය කරනු ලබන නිලධාරින්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |

(ඇ) පළාත් මුදල් රීති
-----------------------

| | | |
|---|---|---|
| (i) 237 | - | මාස 06 කට අධික කාලයක් මුදල් නොකර පැවති රු.1,354,044 ක්වූ චෙක්පත් 151 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. |
| (ii) 433 | - | සමාලොචිත වර්ෂය තුල සභාවේ වාහන වලට අදාල පිළිවෙළින් රු.821,147 ක් සහ රු.693,833 ක් වූ ඉන්ධන සහ අළුත්වැඩියා වියදම් වාහන වල මාසික සංසිද්ධි සාරාංශවල සටහන් නර නොතිබුණි. |

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.399,527 ක්වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.10,667,880 ක් විය.

3. පද්ධති සහ පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) ආදායම් රැස්කිරිම.